(1)
00033

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන 2018/2019

අවසාන පරීක්ෂණය -2020

ESC2222/EPA2422/EPC2422 - ළමා අයිතිවාසිකම්

කාලය - පැය තුනයි.(03)

---

දිනය - 19.07.2020 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. පූර්ව යටත් විජිත යුගයේ දී ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය කෙටියෙන් විස්තර කරන්න.

02. ළමා අයිතිවාසිකම් සඳහා පදනම් වන මූලධර්ම දක්වන්න.

03. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර (04) කවරේ ද?

04. ශ්‍රී ලාංකික දරුවන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීම පිණිස රජයයන් මගින් ගන්නා ලද පියවර පහක් (05) ලියන්න.

05. ජීවත්වීමට ඇති අයිතියෙහි වැදගත්කම කෙටියෙන් දක්වන්න.

06. "අපත්‍යීකරණය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

07. ළමයින් සතු " සහභාගිත්ව අයිතිය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

08. පෙර පාසල් ළමයින් අරහයා වර්ධනය හා සංවර්ධනය සඳහා වන අයිතිය සුරැකීමට පෙර පාසල් ගුරුවරියට ගත හැකි වගකීම් හතරක් (04) ලියන්න.

(ලකුණු 05 X 08 = 40)

## 2 වන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අධ්‍යාපනය හා පෝෂණය දියුණුව සඳහා නිදහසින් පසු රජයයන් ගන්නා ලද පියවර (අවම 5 ක්) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඉහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමේ දී රජය මුහුණ දුන් ගැටලු තුනක් **(03)** සඳහන් කර, ඒවා අවම කළහැකි යෝජනා ලැයිස්තු ගත කරන්න. (ලකුණු 12)

10. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ සංයුතිය හා එහි මූලික කාර්යයන් තුනක් **(03)** සැකෙවින් දක්වන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන මගින් ළමා අයිතීන් සුරක්ෂණය සඳහා ගෙන ඇති පියවර පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) ළමයින් සම්බන්ධව "සුරක්ෂණය සඳහා අයිතිය" යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් සිදුවන ළමයින්ගේ සුරක්ෂණය සඳහා වන අයිතිය කඩවන අවස්ථා තුනක් **(03)** සුදුසු නිදසුන් ඇතිව පෙන්වා දෙන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත සඳහන් කළ අවස්ථාවන් අවම කර ගත හැකි පියවර දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් "යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සුරක්ෂණය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ රැකවරණය අරභයා පවුල වෙත පැවරෙන ප්‍රධාන වගකීම පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඉහල නැංවීමෙහි ලා පූජ්‍ය පක්ෂයට වැදගත් භූමිකාවක් ඇරිය හැක. සුදුසු උදාහරණ සහිතව හේතු දක්වන්න. (ලකුණු 10)

(ii) අවාසිදායක තත්ත්වයේ පසුවන ප්‍රජාව ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි ගැලපෙන සන්නිවේදන ක්‍රමෝපායන් තුනක් **(03)** සඳහන් කර ඉන් එකක් **(01)** විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.